යම් පුවතකට සෘජුව අදාළ නොවන්නේ නම්, පුවත් වාර්තාවක යමෙකුගේ වාර්ගිකත්වය සඳහන් නොකරන ලෙසින් මාධ්‍ය ආචාර ධර්ම උපදෙස් දෙයි. මෙය වැදගත් වන්නේ, සෘණාත්මක සන්දර්භයකදී සිදුවීමට සෘජුව අදාළ නොවන වාර්ගිකත්වයන් සඳහන් කිරීම ඔස්සේ, එම වාර්ගිකත්වයන් ද සෘණාත්මකව ඒකාකෘතික වීමට ඇති හැකියාව නිසාය.

ඉන්දියාවේ පම්බන් වරායේ සිට මන්නාරමට නීති විරෝධීව ප්‍රවාහනය කිරීමට කටයුතු යොදා තිබූ කෝටි අටක මත්ද්‍රව්‍ය, මුහුදු කූඩැල්ලන්, එනසාල් සහ කහ තොගයක් සමඟින් සැකකරුවන් දෙදෙනෙකු රාමනාදන්ප්‍රම් නාවික හමුදාවේ අත්අඩංගුවට පත් වීමේ පුවත දිනමිණ පුවත්පතේ (පෙබරවාරි 01, 2024) වාර්තා වී තිබූ ආකාරය, ඉහත පසුබිම ඔස්සේ සලකා බැලිය හැක.

මෙහිදී සැකකරුවන් දෙදෙනාගෙන් එක් අයෙකු ඉන්දීය ජාතිකයෙකු සහ, අනෙක් අය මන්නාරමේ පදිංචි ද්‍රවිඩ ව්‍යාපාරිකයෙකු යැයි සඳහන් වී තිබිණි.

එම එක් සැකකරුවෙකුගේ වාර්ගිකත්වය "ද්‍රවිඩ" වීම මෙම පුවතට අදාළ වේද? එය අදාළ නොවේ නම්, අදාළ නොවන වාර්ගිකත්වයක් ඉස්මතු කොට දැක්වීම මාධ්‍ය මාර්ගෝපදේශ උල්ලංඝනය කිරීමක් නොවන්නේ ද?

අදාළ නොවන වාර්ගිකත්වය ඉස්මතු නොකරමු!

මූලාශ්‍ර:

https://www.rtdna.org/racial-identification

https://accountablejournalism.org/ethics-codes/nuj-race-reporting-guidelines

https://www.editorscode.org.uk/the_code.php

